පළාත් පාලන ආයතන වල මාර්ග ආලෝකන පහන් පද්ධතිය ස්ථාපනය සහ නඩත්තුව

පී.යූ.පී.කුමාර ද සිල්වා

දකුණු පළාත් ඉංජිනේරු සේවා කාර්යාලය

කොටුව, ගාල්ල.

077 730 4248

udayapushpa@sltnet.lk

* (යෝජනා, නිරීක්ෂණ හා නිර්දේශයන් සඳහා 2018 දෙසැම්බර් 31 දක්වා විවෘතයි)

වයඹ දිනමිණ
NORTH WESTERN

වයඹ
NORTH WESTERN දිනමිණ

සංස්කරණය - සමන්ති වනිගසේකර

පුවත් කෙටියෙන්

පාරට වතුර ජනතාවට පීඩා

මුන්නෙශ්වරම් සමූහ ටී. සී. ප්‍රනාන්දු

ගතවූ මාස දෙකක පමණ කාලයක සිට ඇදහැලෙන අධික වර්ෂාව නිසා එකතු වන වැසි ජලය නිසි ලෙසින් ගලා යාමට අවශ්‍ය මාර්ගයක් නොතිබීම නිසා තමන් මේ වන විට දැඩි දුෂ්කරතාවකට මුහුණ පා සිටින බව හලාවත මයික්කුලම් ප්‍රදේශවාසීහු පවසති. මයික්කුලම් ග්‍රාමීය සාමාන්‍යයෙන් පහත් බිම් රැසකින් පිරී පවතින අතර අතීතයේ මෙහි පැවැතියේ විශාල පොල් වතුය. නමුත් මේ වන විට එම වතු කොටස් කර අපිළිවෙළකට නිවාස ඉදි කිරීමට දීමෙන් හා විකිණීමට අවසර දීම නිසා ප්‍රදේශයේ සියලු ඇළ මාර්ග සියල්ලක්ම වාගේ වැසී ගොස් ඇත. ...ගැටලුවකට ලක්ව ...

දවල්ට දැල්වෙන ලයිට් ගලවමු

උප සභාපති ජයම්පති බන්දුරාජ්

ලයිට් නිවන්න බෑ කරන්ට් වදිනවා

එස්. රවි කුමාර් (ස්වාධීන)

වනාතවිල්ලුව සමූහ සහ පුත්තලම සංචාරක

වීථි ලාම්පු සවි කිරීමට යාමේදී සේවා කාලයට වැඩ කරද්දි ඉතාම හවස් වෙලා එන්න වෙනවා ලයිට් හදන්න ගිය පසු. ඒ නිසා පැය 60ක අතිකාල දීමනාවක් ලබා දෙන්න යැයි පුත්තලම ප්‍රාදේශීය සභාවේ සභාපති අංජන සඳරුවන් මහතා එහි මහ සභා රැස්වීමේදී පැවසීය. සභාපති අංජන සඳරුවන් මහතාගේ ප්‍රධානත්වයෙන් මදුරන්කුලිය පිහිටි ප්‍රධාන කාර්යාලයේදී සභා රැස්වීම පැවැත්විණි.

අකිල සම්පත් මහතා (ජ.වි.පෙ)

මේ ලයිට් සම්බන්ධව ප්‍රශ්නයක් තියෙනවා. සභාවේ අය කරන්නේ එක වීථි ලාම්පුවක් හදලා එන එකයි හැබැයි පනුවද වෙද්දි. වෙන්නෙ අල්ලපු කණුවෙ වීථි ලාම්පුව අක්‍රිය වෙන එකයි.

උප සභාපති ජයම්පති බන්ධුරාජ් මහතා (ශ්‍රී.ල.නි.ප)

අපි මහා සභාවේ ගත්තු තීරණයක් තියෙනවා. දහවල් කාලයේ දැල්වෙන, වීථි ලාම්පු ගලවන්න කියලා. මම ඒක කියනකොට ඒ අය මට කිව්වෙ ප්‍රාදේශීය සභාවෙන් ලියුමක් ගහන්න අපි හෙට ඉඳලා ක්‍රියාත්මක වෙනවා කියලා. ඒ නිසා ප්‍රාදේශීය සභාවේ ලියුමක් ගහලා මේ දහවල් කාලයේ පත්තුවෙන ලාම්පු අනිවාර්යයෙන් ගැලවිය යුතුයි. මොකද පැය විසි හතරේම පත්තු වෙනවා.

නිමල් බමුණු ආරච්චි මහතා(පො.ජ.පෙ)

අපේ විමලසේන මන්ත්‍රීතුමත් දකින්න ඇති අපේ පැත්තේ ලයිට් නිමන්නෙ නැති හරි හිතුවක්කාර දෙන්නෙක් තුන් දෙනෙක් ඉන්නවා. මට වෙලාවකට හිතෙනවා මේ වගේ ඇති වලට තෙ අපි ලයිට් ගයිකොරුවේ කියලා. අර කතාවක් කියනවනෙ කිව්වොත් සඟ නගී නොකිව්වොත් වෙනෙර නගී කියලා. මේක කියන්න ගියොත් ඊළඟ මැතිවරණයට පාවිච්චි කරනවා මේ කතාව. ඒ නිසා ගරු සභාපති තුමණි මම කියන්නෙ. පළමු වතාවට ඒ අයව මතක් කරන්න. මොකද හුඟාක් දුරට කරන්ට් එක යනවා සමහර වේලාවට තව දෙයක් තමයි අපි දැනුවත් නොකර ගලවන්න ගියොත් ලොකු ගැටළුවක් මතුවෙනවා ඒ නිසා මම කියන්නෙ පළමු වතාවට දැනුවත් කරන්න කියලා. දෙවැනි කාරණය ගරු සභාපති තුමණි මේ වීථි ලාම්පු අලුත්වැඩියා කරන දෙන්නට කියන්න. ගමකට ගියාම කරන්නෙ කියන කණුවේ ලාම්පුව විතරයි හදන්නෙ වෙන අල්ලපු ගෙදර කෙනා දුවගෙන ඇවිල්ලා කිව්වොත් අපේ ලාම්පුව කැඩිලා කියලා ඒගොල්ලො දෙන උත්තරේ තමයි සභාවට ලියුමක් දෙන්න කියන එක. ඒක ඔබ තුමාගෙ වරදක් නෙමෙයි කාර්මිකයින්ගෙ වරදක් නෙමෙයි කාර්යාලයේ වරදක් මොකද මෙහෙත් උපදේශයක් දෙද්දි දෙන්න ඕනෙ යන මාර්ගයේ තියෙන වීථි ලාම්පුවක් අළුත්වැඩියා කරන්න යනවානම් ඒ මාර්ගයේ පිච්චිලා තියෙන සියළුම ලාම්පු අලුත්වැඩියා කරන්න කියලා කාර්මිකයින්ව දැනුවත් කරන්න.

රිෆාස් කලුපහන මහතා (ශ්‍රී.මු.කො)

20% වීථි ලාම්පු අක්‍රිය වෙලා තියෙනවා. 80% විදුලි පහන් වල බාහිර දෝෂ පවතිනවා. ඒ කියන්නෙ ස්විච් සහ වයර් වල පවතින දෝෂ හේතුවෙන් මේ හේතු නිසා අපේ ප්‍රදේශයේ ජනතාව දැඩි අපහසුතාවයට පත්වෙලා සිටිනවා. ඒකට විසඳුමක් වශයෙන් දැන් තියෙන තාක්ෂණය අනුව ස්වයංක්‍රීය විදුලි පහන් වලට අවශ්‍ය පරිපථයක් සවිකිරීම සුදුසුයි. මොකද ඒ පහන අප විසින් නඩත්තු කළ යුතු නැහැ රාත්‍රියට දැල්වෙනවා. දහවල් කාලයේ නිවෙනවා අන්න ඒ වගේ වැඩ පිළිවෙළක් අපේ සභා බල ප්‍රදේශයට සිදුසුයි කියලා මම යෝජනා කරනවා.

සභාපති අංජන සඳරුවන් මහතා (එ.ජා.ප)

මම දන්නම ලේකම් තුමාව දැණුවත් කලා ලිපියක් සකස් කරලා ඒ අයව දැණුවත් කරන්න කියලා. අපි පළමුවෙන්ම ලයිට් නිවන්න කියලා ලිපිය මඟින් දැණුවත් කරමු. දෙවනුව අපි වයර් එකෙන් විසන්ධි කරලා එමු. අපි එකපාරටම ගලවන්න යන්නෙ නැහැ මන්ත්‍රී තුමාලා එහෙම කලබල වෙන්න එපා.

නිමල් බමුණු ආරච්චි මහතා(පො.ජ.පෙ)

ලංකා විදුලි බල මණ්ඩලය විසින් ඉස්සරම වුණේ ප්‍රධාන මාර්ගය අයිනෙ තමයි. දැන් අතුරු මාර්ගවල වෙනවා. හරි නම් ප්‍රාදේශීය සභාව මඟින් තමයි ගෙවන්න ඕනෙ. නමුත් කාලයක් යද්දි සභාව මඟින් ගෙව්වෙ නැහැ මම හිතන්නෙ ප්‍රාදේශිය සභා මට්ටමෙන් ගත්තොත් එහෙම මේ බල ප්‍රදේශයෙම තියෙන සභාව සතු දේවල් විකුණුවත් අපිට විදුලි බල මණ්ඩලයට වීථි ලාම්පු වලට ගෙවන්න තියෙන සල්ලි ගෙවන්න බැහැ. එච්චර මුදලක් තියෙනවා ගෙවන්න. ඒ නිසා ලංකා විදුලි බලමණ්ඩලය විසින් ඔබටත් අපටත් හොරා හොදන්වා විදුලි බිලට වීථි ගාම්පුවක් නිවස ඉදිරිපිට තියෙනවානම් රුපියල් 100ක් අය කරන බව කරුණාවෙන් මතක තබා ගන්න.

එස්.රවි කුමාර් මහතා(ස්වාධීන)

මෙහෙ වීථි පහන් නිවන්නෙ නැති ගැටළුවක් ගැන සාකච්ඡා කලා. අපේ ගරු මන්ත්‍රී තුමා කිව්වා ස්වයංක්‍රීය විදුලි පහන් ක්‍රමය සුදුසුයි කියලා. මමත් ඒ යෝජනාවට එකඟයි මොකද අපි දැන් තවත තාක්ෂණය සමඟ යන්නෙ මොහොතක් හිතන්න දැන් තියෙන වීථි ලාම්පුවක් සවි කිරීමට යන වියදම සහ කාලය කලින් සඳහන් කල ස්වයංක්‍රීය පහන් වලට අවශ්‍ය වෙන්නෙ නැහැ. තව දෙයක් තමයි මේ වීථි පහන් නිවන්න ජනතාව කිසිම විටක පසුබට වෙන්නෙ නැහැ අලසත් නැහැ. නමුත් ඒ පහන්වල ස්විච්ච වලට අත තියන්න බැහැ විදුලිය කාන්දු වෙනවා. සමහර අවස්ථාවලදී මම දැකලා තියෙනවා සකුලෙ දන සෙරප්පුව ගලවලා මිනිස්සු වීථි පහන නිවන ආකාරය. ඒ විතරක් නෙමෙයි තව සමහරු ලී කෑබිලි භාවිතා කරන අවස්ථාද පවතින එවැනි අවස්ථා වලදී ස්විච්චියට හානි සිදුවෙනවා. සභාව කෝටි ගාණක මුදලක් මේ වෙනුවෙන් වැය කරද්දි ස්වයංක්‍රීය පරිපථ සවි කිරීමට යන මුදල 80% අඩු වෙනවා එවැනි ක්‍රමයක් සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

අකිල සම්පත් මහතා (ජ.වි.පෙ)

අපි සෙන්සර් ගැන කතා කරලා වැඩක් නැහැ දැන් මිනිස්සුන්ටත් සෙන්සර් නැතුව තියෙන්නෙ. ඒ නිසා අපි මිනිස්සුන්ට යුතුකම් කියන කොට පුරුදු කරමු මිනිස්සුත් අපි ඒවාට හැඹුරු කරමු තමන්ගේ ගෙදර ලයිට් එක වෙලාවට නිවනවා නම් ඇයි පාරේ ලයිට් එක නිවන්න බැරි ඒ නිසා අපි ජනතාව දැනුවත් කරමු.

පුත්තලම ප්‍රාදේශීය සභාව

පළාත් පාලන ආයතනවල
වීදි පහන් ආලෝකය සහ නඩත්තුව

පළාත් පාලන ආයතන සතු උපයෝගී සේවාවන් ලබාදීමේදී ප්‍රමුඛතම වගකීමක් මාර්ග ආලෝකන පද්ධති විධිමත්ව පවත්වාගෙන යාම මහනගර සභා සහ නගර සභා ආඥාපනත් අනුව මෙන්ම ප්‍රාදේශීය සභා පනත අනුව තම බල ප්‍රදේශයේ මාර්ග ආලෝකන පහන් පද්ධතිය ස්ථාපනය සහ නඩත්තුව ඒ ඒ පළාත්පාලන ආයතනවලට පැවරී ඇත. පාර, මාවත්, මංතීරු, වීදි, මහා මාර්ග සහ උමං මාර්ග ද ඇතුළු පොදු විනෝදස්ථාන ප්‍රදේශ සහ උද්‍යාන වලද රාත්‍රී ආලෝකනය පළාත් පාලන ආයතන මගින්ද අධිවේගී මාර්ගවල ආලෝකන කටයුතු මාර්ග සංවර්ධන අධිකාරිය මගින්ද සිදුකරනු ලබයි.

ජාතික විදුලිබල පද්ධතියේ ප්‍රධාන පාර්ශ්වකරුවන් ලෙස ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි (පුද්) සමාගම කටයුතු කිරීමේදී අදාළ ප්‍රදේශවල මාර්ග ආලෝකන පහන් නඩත්තුවට අවශ්‍ය පහසුකම් ලබාදීම ඔවුන්ගේද වගකීමකි.

*මාර්ග ආලෝකනය වූ වීදි පහන්

අතීතයේ දෙපස වාණිජ කටයුතු සහ නේවාසිකයන් පදිංචි වූ මාර්ග වීදි (Streets) ලෙස හැඳින්වූ අතර [illegible]

[illegible]

IV. 110W සෝඩියම් (SV) වේපර් පහන්
V. 210W සහ 250W සෝඩියම් වේපර් පහන්
VI. 250W සහ 400W mv රසදිය පහන්
VII. 18W - 20W - 23W CFL බල්බ
VIII. LED පහන් (නූතනාලීනව)

*විදුලි බල සහ බලශක්ති අමාත්‍යාංශය නිර්දේශ කර ඇති විදුලි පහන්වල ක්ෂමතාව (W) සහ සංඛ්‍යාව

*1998-03-16 දිනැති අංක IPE/PE/12/31 චක්‍රලේඛ අනුව

*මහා නගර ප්‍රදේශ

ද්විත්ව ධාවන පථ සහිත මාර්ග 220 වොට් (W) අධි පීඩන සෝඩියම් වාෂ්ප ලාම්පු පරතරය මීටර 45 ලාම්පු කණු පිහිටිය යුතු ආකාරය මධ්‍යම දූපතේ.

*තනි ධාවන පථ සහිත මාර්ග

220 වොට් අධිපීඩන සෝඩියම් වීදි ලාම්පු පරතරය මීටර 45

[illegible]

භාණ්ඩ විස්තරය	අවශ්‍ය ප්‍රමාණය	ප්‍රමිතිය	නිෂ්පාදන නාමය	නිෂ්පාදන රට	වගකීම් කාලය	බදු රහිත ඒකක මිල	මුළු මිලය

[illegible]

• මාර්ග ආලෝකන පද්ධතිය - දල්වීම සහ නිවීම
I. වීදි පහන් දල්වන්නා සහ නිවන්නා
II. වීදි පහන් පාලනය සහිත සැපයුම් මාර්ගයට යොදන ආලෝකන ස්විච (PV Switch)
III. නියමිත කාල පිහිටුවා සකස් කරන ලද ඔරලෝසු
IV. [illegible]

[illegible]

• 20 W (1900 - 2000 Lumens) E27 LED බල්බ Day Light [illegible]
• 20 W (1900 - 2000 lumens) E27 LED බල්බ WARM White ප්‍රධාන මාර්ගය සමග සම්බන්ධ අතුරු මාර්ග ආරම්භ වන (ප්‍රධාන මාර්ගයේ පහන් කණු සඳහා)
• [illegible] අතුරු මාර්ගයන් සඳහා (කණුවක් හැර කණුවකට) 12 W - 12.5 W LED - Day light 1200 - 1250 Lumens බල්බ.
• [illegible] 12 W - 12.5W LED WARM White E27 බල්බ.

*මූලික සත්ත්ව අයිතිවාසිකම්.

රාත්‍රී කාලයේදී Day light පහන් භාවිතා කිරීමෙන් සතුන් [illegible]

[illegible]

පී.යූ.පී. කුමාර ද සිල්වා,
පළාත් ඉංජිනේරු සේවා කාර්යාලය,
ගොටුව , ගාල්ල
Udayapushpa@sltnet.lk - 0777304248

* පළාත් පාලන ආයනත වල මාර්ග ආලෝකන පද්ධති ස්ථාපනය සහ නඩත්තුව.

පළාත් පාලන ආයතන සතු උපයෝගී සේවාවන් ලබා දීමේදී ප්‍රමුඛතම වගකීමක් මාර්ග ආලෝකන පද්ධති විධිමත්ව පවත්වාගෙන යාම මහනගර සභා සහ නගර සභා ආඥාපනත් අනුව මෙන්ම ප්‍රාදේශීය සභා පනත අනුව තම බල ප්‍රදේශයේ මාර්ග ආලෝකන පහන් පද්ධතිය ස්ථාපනය සහ නඩත්තුව ඒ ඒ පළාත් පාලන ආයතන වලට පැවරී ඇත. පාර, මාවත්, මංතීරු, වීථි, මහා මාර්ග සහ උමං මාර්ග ද චතුරස්‍ර ඇතුලු පොදු විනෝදාස්වාදන ප්‍රදේශ සහ උද්‍යාන වලද රාත්‍රී ආලෝකනය පළාත පාලන ආයතන මඟින්ද අධිවේගී මාර්ග වල ආලෝකන කටයුතු මාර්ග සංවර්ධන අධිකාරිය මඟින්ද සිදු කරනු ලබයි.

ජාතික විදුලිබල පද්ධතියේ සැපයුම් කරුවන් ලෙස ලංකා විදුලිබල මණ්ඩලය සහ සී/ස ලංකා විදුලි (පුද්) සමාගම කටයුතු කිරීමේදී අදාල ප්‍රදේශ වල මාර්ග ආලෝකන පහන් නඩත්තුවට අවශ්‍ය පහසුකම් ලබාදීම ඔවුන්ගේද වගකීමකි.

* මාර්ග ආලෝකනය වූ වීථි පහන්

අතීතයේ දෙපස වාණිජ කටයුතු සහ නේවාසිකයන් පදිංචි වූ මාර්ග වීථි (Streets) ලෙස හැදින්වූ අතර ඒවා නාගරික සීමාවේ විය. පදිකයන්ගේ ආරක්ෂාව, සොර සතුරු බිය අඩුකර ගැනීමට මෙන්ම අලංකාරය සඳහා ද එම වීථි පහන් උපකාර වූ අතර වීථි පහන් ලෙස ඒවා නම් කර භාවිතා විය.

එහෙත් වීථි පහන් වලට අමතරව මාවත්, මංතීරු, පාර, මහාමාර්ග මෙන්ම චතුරස්‍ර සහ එලිමහන් උද්‍යාන වලද රාත්‍රී ආලෝකනය සහ පහන් භාවිතා කරන බැවින් මෙම පහන් සහිත පද්ධතිය මාර්ග ආලෝකන පද්ධති ලෙස හැදින්විය යුතු වේ.

අතීතයේදී කොප්පර කැකුණ මී ඉටි පොල්තෙල්, පූනක්කු මෙන්ම පසු කාලීනව ගෑස් ලාම්පුද වීථි ආලෝකනය සඳහා භාවිතා කර ඇත. (උදා : මහ නුවර දළදා පෙරහැර කාල සීමාව).

* මාර්ග ආලෝකන පහනක් යනු,

මාර්ගයක අයිනේ සිටුවා ඇති කණුවකින් නිකුත් වන ආලෝකන ප්‍රභවයකි.

ශ්‍රී ලංකාවේ වීථි පහන් පද්ධතිය - මාර්ග ආලෝකනය.

ප්‍රථමයෙන්ම මෙම වීථි පහන් නඩත්තු කරනු ලැබුවේ තමන් සතු විදුලි ජනක යන්ත්‍ර මඟින් දවසේ යම් කාලසීමාවන්හිදී සිය විදුලි පාරිභෝගිකයන්ට විදුලි බලය සැපයූ දිවයිනේ ඉතාමත් සීමිත ප්‍රදේශයක මහනගර සභා හා නගර සභා යන පළාත් පාලන ආයතන මඟිනි.

1950 වර්ෂයේ ලංකා විදුලිබල මණ්ඩලයේ ආරම්භයට පෙර විදුලිබල පද්ධතිය ක්‍රියාත්මක කරන ලද එම පළාත් පාලන ආයතන අතර කොළඹ, ගාල්ල, මහනුවර මෙන්ම තිස්සමහාරාමය ද විය.

එයට පෙර ගෑස් ලාම්පු දල්වා නගර ආරක්ෂාව මෙන්ම අලංකරණය කරීම කොළඹ මහනගර සභාව සිදු කර ඇත.

අතීතයේ ග්‍රීක සහ රෝමන් වරුන්ද අලංකාරය ආරක්ෂාව මෙන්ම සොර සතුරු බියෙන් අත්මිදීට ද ප්‍රාථමික වර්ගයේ පහන් වීථිවල දල්වා ඇති බව ඉතිහාස පොත් වල සඳහන් කර ඇත. එසේම තම නිවසේ ඉදිරිපිට පහන් දැල්වීමට අනිවාර්ය කර තිබුණි.

* <u>මාර්ග වර්ගයන් අනුව</u>

I. පළාත් පාලන ආයතන සතු මාර්ග (වීථි, මාවත්, චතුරස්‍ර, පාර්වල් ද ඇතුලත් වේ.)

II. පළාත් සභා සතු මාර්ග හා මහාමාර්ග.

III. මධ්‍යම රජය සතු - මහාමාර්ග මෙන්ම අධිවේගී මාර්ගද වේ.

* <u>මාර්ග ආලෝකන සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සහ සි/ස විදුලි (පුද්) සමාගම වෙන්කරනු ලබන විදුලි ඒකක ප්‍රමාණය.</u>

මහනගරසභා, නාගරික ප්‍රදේශ (සංවර්ධන) - ගෘහස්ථ සහ පොදු කාර්යය සිල්ලර පරිභොජනයෙන් 2%

ග්‍රාමීය ප්‍රදේශ (සංවර්ධනය අඩු උනත් සංවර්ධනය)

අදාල ප්‍රදේශයේ ගෘහස්ථ සහ පොදු කාර්යය සිල්ලර පාර්භෝජනය 3%

* <u>බල ශක්ති සමානාත්මතාවය</u>

ඉහත ප්‍රතිශතයන් අනුව වුවද තම බල ප්‍රදේශයේ පුරවැසියන්ට අවම අවශ්‍යතා අනුවද මාර්ග ආලෝකන පද්ධතියක් සවිකර දිමට ඇතැම් අඩු ආදායම් සහිත පළාත් පාලන ආයතන වලට නොහැකි වී ඇත.

පාරිභෝගික අයිතිවාසිකම් මෙන්ම සමාජ සත්කාරයන් ලෙස ලං.වි.ම යන ලෙකෝ (LECO)මාර්ග ආලෝකන නඩත්තු සඳහා රජය විසින් නියම කර ඇති නඩත්තු මුදල් බොහෝ පළාත් පාලන ආයතන වලට නොලැබේ.

එසේ නඩත්තු මුදල් ගෙවීම කිරීම යාවත්කාලීන කර ගත යුතු අතර අදාල පළාත් පාලන ආයතන විසින් නියමිත දත්ත ලං.වි.ම සහ LECO වෙත ලබාදිය යුතු වේ.

* මාර්ග ආලෝකන කණුවක් ද පළාත් පාලන ආයතන ආදායම් නඩත්තු ස්ථානයකි.
නියමිත/අනුමත ප්‍රමාණයේ වෙළඳ දැන්වීමක් සවි කිරිමට අවස්ථාවක් දී යම් බදු මුදලක් අය කිරිමට සහ කුඩා ප්‍රමාණයේ කඩදාසි කැබලි ටොෂි කොළ වැනි දේ ඉවත දැමීමට වෙළඳ ආයතන මඟින් කුඩා කසල බඳුන් සවිකිරිමට ඉඩ ලබාදීමෙන් පරිසරය පිරිසිදුව තබා ගැනීමට මෙන්ම ආදායම් උත්පාදනයට උපයෝගී කර ගත හැක.

* **විදුලි සැපයුම සහ අදායම් උත්පාදනය**

වාණිජ ආයතන ලෙස පළාත් පාලන ආයතන බල ප්‍රදේශ තුල එය බෙදා හැරීම් මාර්ග මෙන්ම මෙහෙයුම් ස්ථානද ලං.වි.ම සහ ලෙකෝ ආයතන ස්ථාපනය කර ඇති බැවින් එම කරණු අනුව යම් බදු මුදලක් අයකර ගැනීමට හැකියාවක් පළාත් පාලන ආයතන වලට ඇත.(බලපත්‍ර ගාස්තුවක් හෝ ආදායම් අනුව ප්‍රතිශතයක්)

පළාත් පාලන ආයතන නඩත්තු කරනු ලැබූ විදුලි බල පද්ධති පවරා ගෙන ලං.වි.ම සහ LECO දැනට කටයුතු කරන අතර අදාල පවරා ගැනීම් වලදී ඇති කරගනු ලැබූ එකගතාව මත වාර්ෂිකව ලැබිය යුතු පාර්ශව කරුවන්ට කොටස් මත හිමි විය යුතු ප්‍රතිලාභ කිසිවක් ගෙවීම සිදු නොවේ.

* **මාර්ග අලංකරණය සඳහා දැනට භාවිතා වන විදුලි පහන් වර්ග,**

I. 60W GLS බල්බ
II. 36 W ප්ලෝරසන්ට් විදුලි බල්බ
III. 125W රසදිය (MV) පහන්
IV. 110W සෝඩියම් (SV) වේපර් පහන්
V. 210W සහ 250W සෝඩියම් වේපර් පහන්
VI. 250W සහ 400 WMV රසදිය පහන්
VII. 18W -20W-23W CFL බල්බ
VIII. LED පහන් (මෑත කාලීනව)

* **විදුලි බල සහ බලශක්ති අමාත්‍යංශය නිර්දේශ කර ඇති විදුලි පහන්වල ක්ෂමතාව (W) සහ සංඛ්‍යාව.**

* 1998-03-16 මාගේ අංක IPE/PE/12/31 චක්‍රලේඛ අනුව
* මහ නගර ප්‍රදේශ

  ද්විත්ව ධාවන පථ සහිත මාර්ග 220 වොට් (W) අධි පථ පීඩන සෝඩියම් වාෂ්ප ලාම්පු පරතරය මීටර 45 ලාම්පු කණු පිහිටම යුතු ආකාරය මධ්‍යම යුගල.

* තනි ධාවන පථ සහිත මාර්ග

  220 වොට් අධි පීඩන සෝඩියම් වීපී ලාම්පු පරතරය මීටර 45

  වීපී ලාම්පු කණු පිහිට විය යුතු ආකාරය පාරට මුහුණලා ප්‍රතිවිරුද්ධ දෙසින් එකිනෙකට සමාන්තර නොවන (ඔපසිට් ස්ටැගර්ඩ් ක්‍රමයට)

* නාගරික ප්‍රදේශ - ද්විත්ව ධාවන පථ සහිත මාර්ග පෙර පරිදි තනි ධාවන පථ සහිත මාර්ග වොට් 150 අධි පීඩන කේවියම ලාම්පු ඉහත පරිදි වේ.
* ග්‍රාමීය ප්‍රදේශ වල - ව්‍යාපාරික ප්‍රදේශ තුල කණුව හැර කණුවක් 110 අධි පීඩන සෝඩියම් වර්ගයේ පහනක් බැගින්.
* අනෙකුත් මාර්ග - අධි ජනාවාස ප්‍රදේශ සෑම කණුවකටම 40 W පියරැසි පහන

* සෙසු ජනාවාස ප්‍රදේශ කණුවක් හැර කණුවකටම පියරැසි පහන බැඟින්.
* මෙම චක්‍රලේඛ උපදෙස් ලබා දී කාල සීමාවේදී මාර්ග දෙපස පැවති ගොඩනැගිලි (ව්‍යාපාරික මෙන්ම ගෘහස්ථ) සාපේක්ෂව සීග්‍ර ලෙස නාගරීකරණය සහ ජනවාස ඉදිකිරීම් නිසා සහ රාත්‍රියේදී මාර්ග වල ගමන් ගන්නා වාහන සංඛ්‍යාවක් ඉතා විශාල ලෙස වැඩිවී ඇති බැවින් ද ඉහත ප්‍රමාණටය වඩා අඩු ආලෝකන මට්ටමකින් (LUX) මාර්ග ආලෝකනයක්ද කර ගත හැක.

එබැවින් ඉදිරි පරිච්ඡේදයේ යෝජනා කරන පහන් වර්ග සහ ඒවායේ කාර්යක්ෂමතාවය (W) ගණන සඳහන් කර ඇත.

* පළාත් පාලන ආයතන සතු මාර්ග ආලෝකන පද්ධතිය නඩත්තු අංශය.

මහනගරසභා සහ නගර සභා සමහරක් ප්‍රදේශීය සභාවන් සතුව ඇතත් බොහෝ ආයතන වල මේ සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැත.

* අවම වශයෙන් එක් ප්‍රාදේශීය සභාවක් සඳහා ප්‍රධාන කාර්යාලයේ
    I. විදුලි කාර්මික (NVQ 4 මට්ටමේ සුදුසුකම් සහිත) - 01
    II. සහකාර විදුලි කාර්මික (NVQ 3 මට්ටමේ සුදුසුකම් සහිත) 03ක්
    III. විදුලි පහන් දල්වන්නා තනතුරු 04 – (හෝ ප්‍රමානවත් සංඛ්‍යාවක්)
    IV. මාර්ග / විදුලි කම්කරුවන් - 03

උප කාර්යාල සංඛ්‍යාව සහ බල ප්‍රදේශයේ අවශ්‍යතාව සහ නඩත්තු කරනු ලබන පහන් සංඛ්‍යාව අනුව ප්‍රමානවත් පරිදි සේවකයන් යෙදවීම අත්‍යවශ්‍ය වේ. ඔවුන්ගේ කටයුතු අධීක්ෂණය ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරියෙක්ට පැවරීම වඩාත් යෝග්‍ය වේ.

* එක් නගර සභාවක් සඳහා
    I අධීක්ෂණ කටයුතු සඳහා ශ්‍රී ලං.තා.සේ.විදුලි හෝ සුදුසු තාක්ෂණ සේවයේ නිලධාරියෙක්
    II විදුලි කාර්මික ශිල්පීන් (NVQ4 මට්ටමේ සුදුසුකම් සහිත) 02ක්
    සහකාර විදුලි කාර්මික (NVQ 3 මට්ටමේ සුදුසුකම් සහිත) 04ක්
    වීථි පහන් දල්වන්නා තනතුරු 05ක් (හෝ ප්‍රමානවත් සංඛ්‍යාවක්)
    විදුලි / මාර්ග කම්කවරුන් 04ක් (හෝ ප්‍රමානවත් සංඛ්‍යාවක්)

බල ප්‍රදේශයේ අවශ්‍යතාවය අනුව සුදුසු පරිදි අවශ්‍ය තනතුරු ඇති කිරීම නිර්දේශ කරනු ලැබේ.

* මහනගර සභාවක් සඳහා
* විදුලි ඉංජිනේරු තනතුරක් නොමැති නම්
    ශ්‍රී ලංකාවේ තාක්ෂණ සේවයේ විදුලි නිලධාරීන් 01

විදුලි කාර්මිකයින් (NVQ 4 මට්ටමේ සුදුසුකම් සහිත) 04ක්

සහකාර විදුලි කාර්මික (NVQ 3 මට්ටමේ සුදුසුකම් සහිත) 04ක්

වීථි පහන් දල්වන්නා තනතුරු 06ක් (හෝ ප්‍රමානවත් සංඛ්‍යාවක්)

විදුලි / මාර්ග කම්කරුවන් 06ක් (හෝ ප්‍රමානවත් සංඛ්‍යාවක්)

තනතුරු නිර්දේශය කරනු ලැබේ.

අවශ්‍යතාවය අනුව

* තනතුරු සම්පූර්ණ කිරීමට පළාත් පාලන ප්‍රධානීන්ට බලතල ඇති බැවින් ඉහත තනතුරු සඳහා සුදුසු පත් කිරීම් නොපමාව කටයුතු කර ගැනීම සුදුසු වේ.

* <u>**විදුලි උපාංග සහ අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම සහ සැපයුම් කරුවන් ලියා පදිංචි කිරීම.**</u>

විදුලි ගබඩාව අවම වශයෙන් මාස 3කට ප්‍රමාණවත් තොග ගබඩාගත කිරීමට අවශ්‍ය ගබඩා පහසුකම් ඇති කිරීම සුදුසු වේ

වර්ෂයේ සෑම නොවැම්බර් මස 01 දින සිට 30 දක්වා කාල සීමාව තුල විධිමත් පරිදි පුවත් ලත් දැන්වීම් සහ ප්‍රචාරණය මඟින් ඉදිරි වර්ෂය සඳහා සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීම සුදුසුය.

නිශ්චිත කාලසීමාවක් තුල එම දැන්වීම් පළ කරන විට මහහැරීමකින් තොරව විශාල සැපයුම් කරුවන්ගේ සංඛ්‍යාවක් ලියා පදිංචි කර ගැනීමට හැකි වේ. එවිට කරඟකාරී ක්‍රමයක් මඟින් විනිවිද භාවයකින් යුක්තව උපකරණ මිලදී ගැනීමට හැකිවනු ඇත.

එසේම සැපයුම්කරුවන් ලියා පදිංචි කිරීමේදී ඔවුන්ගේ ව්‍යාපාර නාමය ලියාපදිංචිය පසුගිය වර්ෂ වල සැපයුම් කරන ලද පළාත් පාලන ආයතන පිළිබඳ විස්තර බැංකු ගිණුම් ප්‍රවාහනය කර ගබඩාවට භාරදීම ණය පහසුකම් ලබාදෙන කාලසීමාව සහ මිල ගණන් වලංගු කාලසීමාවද සභාව අපේක්ෂිත වෙනත් සුදුසු නිර්ණායකයක් (සාම්පල සැපයීම, සභාවේ නම මුද්‍රනය)ද ඇතුලත් කිරිම නිර්දේශ කරනු ලැබේ.

මිල ගණන් කැඳවීමේ විධිමත් ආකෘතියක් භාවිතා කර යුතු අතර ඒ සඳහා භාවිතා කල හැකි පිරිවිතර සහ ප්‍රමිතින් ඉදිරියේ සඳහන් කර ඇත.

මිල ගණන් භාරගන්න අවසාන දිනය සහ වෙලාව මිල ගණන් විවෘත කර දිනය සහ වේලාව,මිල ගණන් වලංගු විය යුතු කාල සිමාව අවශ්‍ය නම් මිල කියුම්කරුගේ නියෝජිතයකුට එම අවස්ථාවට සහභාගී වීමට සැපයුම්කරුවන්ට ඉඩ දි ඇති බව සඳහන් කළ යුතුය. මිල කැඳවිමේ දැන්විම අවම වශයෙන් සෑම ලියාපදිංචි සැපයුම් කරුවකුටම ලියා පදිංචි තැපෑලෙන් යැවිය යුතු අතර දින 14 ක කාලයක් ලබා දිය යුතුය. මිලගණන් කැඳවිමේ පිරිවිතර සහ ප්‍රමිතිය පිළිබඳ ලේඛනය සමඟ සාම්පල පරීක්ෂාවට අවශ්‍ය වන අයිතම සඳහා මිලගණන් සමඟ සාම්පල ඉදිරිපත් කිරීම අනිවාර්ය විය යුතු අතර එසේ ඉදිරිපත් නොකරන මිල ගණන් ප්‍රතික්ෂේප කල යුතු වේ.

* **<u>මිල ගණන් කැඳවීමමේ පිරිවිතර සහිත ලේඛන.</u>**

භාණ්ඩ විස්තරය	අවශ්‍ය ප්‍රමාණය	ප්‍රමිතිය	නිෂ්පාදන නාමය	නිෂ්පාදන රට	වගකීම් කාලය	බදු රහිත ඒකක මිල	මුළු මුදල

මිල ගණන සමඟ අදාල අයිතමය සඳහා සාම්පල ඉදිරිපත් කළ යුතුය.

* සපයන උපකරණ වල වල සභාවේ නම උපදෙස් පරිදි මුද්‍රණය සටහන් කර තිබිය යුතුය.

* **<u>මිල ගණන් විවෘත කිරීම.</u>**

සඳහන් කළ තිබූ පරිදි දින නියමිත වෙලාවට අදාල ටෙන්ඩර් මණ්ඩල / කමිටු ඉදිරියේදී මිල ගණන් විවෘත කළ යුතු අතර සාම්පල ඉදිරිපත් කිරීම අනිවාර්ය කර තිබූ භාණ්ඩ / උපාංග විධිමත් ලෙස සලකුණු කර ගබඩාවට බාරදිය යුතුය.

* **<u>තාක්ෂණික ඇගයීම,</u>**

සභාව විසින් පත් කරන ලද ටෙන්ඩර් / මුදල් කමිටුවක් මඟින් නම් කරන තාක්ෂණික ඇගයිම් කමිටුවක් මඟින් තාක්ෂණික ඇගයීම සඳහා පත් කල යුතු අතර විදුලි උපකරණ සහ උපාංග මිලදී ගැනීමේ දී විදුලි ඉංජිනේරු, ශ්‍රී ලං.තා.සේ (විදුලිය) නිලධාරියකු අනිවාර්ය සාමාජිකයෙකු විය යුතු අතර එසේ නොවන අවස්ථා වලදී ශ්‍රී තාක්ෂණ සේවයේ සුදුසු නිලධාරියෙක් සහභාගී කර ගැනීම විධිමත් ඇගයීම් ක්‍රියාවලියකට හේතුවේ.

* **<u>භාණ්ඩ සැපයීම සහ ගෙවීම් කිරීම,</u>**

අදාල පිරිවිතර සහ සාම්පල පරීක්ෂාවෙන් පසු ලබාගත් භාණ්ඩ විධිමත්ව ගබඩා කළ යුතු අතර තොග සැපයීමකදී මුල් සාම්පලය සියළුම භාර දීම් අවසන් කරන තෙක් සැපයුම්කරුට ලබා දීමට නොකළ යුතුය.

නියමිත පරිදි ඉල්ලා සිටින ලද භාණ්ඩ ප්‍රමාණය සම්පූර්ණ කරන තෙක් කොටස් ගෙවීම නොකල යුතු අතර සැපයීම් සම්පූර්ණ කිරීමෙන් පසු අප්‍රමාදව ගෙවීම් කිරීම කල යුතුය.

* **<u>සැපයුම්කරුවන් අසාධු ලේඛන ගත කිරීම.</u>**

නිසි පරිදි සැපයුම් නොකරන ලබන සැපයුම් කරුවන් අසාධු ලේඛන ගත කර අනෙකුත් ආයතන වලට දැනුම්දියයුතුය.

* අවභාවිතය සහ නාස්තිය වලකා ගැනීම පිණිස ගබඩාවට ලැබෙන උපාංග වල විලාසය සටහන් කිරීම අවම වශයෙන් මුල් අක්ෂර 3කින් වත් ආයතනයේ නම නොමැකෙන තීන්ත වලින් සටහන් කිරීම.

  (උදා: ගා.ම.න.ස, ත.ප්‍රා.ස, අ.න.ස - ගාල්ල මහනගර සභාව, තංගල්ල ප්‍රාදේශීය සභාව, අම්බලන්ගොඩ නගර සභාව)

* **<u>විදුලි ගබඩාවේ භාණ්ඩ නිකුත් කිරීම සහ හර ගැනීම.</u>**

  - ✓ භාණ්ඩ ඇනවුම් කිරීමේ ලේඛනය
  - ✓ භාවිතා නොකරන ලද ද්‍රව්‍ය ආපසු ගබඩාවට භාරදීමේ ලේඛනය
  - ✓ භාවිතා කළ නොහැකි භාණ්ඩ භාරදීම.

නියමිත ලේඛන මඟින් සිදු කළ යුතුය.

* **<u>ගබඩාවෙන් භාණ්ඩ ඇනවුම් කිරීම.</u>**

ඇනවුම් කරනු ලබන ද්‍රව්‍ය වර්ගය එම උපකරණ හා උපාංග යොදනු ලබන පහන් කණුවේ අංකය සටහන් කල යුතු අතර අදාල තොරතුරු සහ එම යෙදවීම ලේඛනගත කළ යුතුය. හැකි සෑම විටම පරිගණක තාක්‍ෂණය භාවිතය උපයෝගී කර ගැනීම සම්පත් අපතේයාම වලක්වා ගැනීමට හේතුවේ.

* **<u>පසු භාවිත කලමනාකරණය</u>**

MV CFL F/L SV වැනි පරිසරයට අහිත කර පහන් ඉවත් කිරීමේදී අදාල සැපයුම් කරුවන් විධිමත් ලෙස ඒවා ඉවත්කිරීමට එකගවන්නේ නම් ඔවුන්ට මිල ගණන් කැඳවීමේදී ප්‍රමුඛතාවයක් ලබා දීය යුතුය.

* **<u>මංවර එළි කිරීම</u>**

යෙදිය යුතු පහන් සංඛ්‍යාව අඩුකර ගැනීමට සහ ක්‍ෂමතාව අඩු පහන් යෙදවීමට හැකිවීම සහ මාර්ග වල නඩත්තු වියදම් අවමකර ගැනීමට සහ සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කරගැනීමට හැකි වේ.

* **<u>මාර්ග ආලෝකන පද්ධතිය ලේඛනය</u>**

- <u>සභාව සතු වත්කම්කි.</u>

පළාත් පාලන ආයතන මඟින් නඩත්තු කරනු ලබන පහන් සභාව සතු වත්කමක් වන බැවින් එක් එක් පාර වීථි, මාවත මාර්ග වල පහන් සවිකර ඇති කණු අංකනය කර එහි සවිකර පහනේ වර්ගය ක්‍ෂමතාව ලේඛන ගත කිරීම අනිවාර්ය වේ.

මෙම ලේඛනය මඟින් අවිධිමත් මෙන්ම අක්‍රමවත්ව සවිකිරීම් සඳහා ඉඩ නොලැබෙන අතර බල ප්‍රදේශවල අවශ්‍ය ස්ථානවලට නව සවිකිරීම් සිදු කිරීමටද උපයෝගී කරගත හැකි නෛතික

ලේඛනයක් වනු ඇත. අධිකරණ කටයුතු වලදී අපරාධ මෙන්ම මිනිස් ඝාතන සහ සොරකම් වලදී මාර්ග ආලෝකන පහන් ක්‍රියාත්මක වීමේ තත්වය පිළිබඳ අදාල නලධාරීන්ට අධිකරණය වෙත සාක්ෂි ඉදිරිපත් කිරීමට සිදුවන අවස්ථා ඇත.

- මාර්ග ආලෝකන පද්ධතිය - දැල්වීම සහ නිවීම.
    - I. වීථි පහන් දල්වන්න සහ නිවන්නා
    - II. වීථි පහන් පාලකය සහිත සැපයුම් මාර්ගයට යොදන ආලෝකන සංවේදිවර්‍ර (PV switch)
    - III. නියමිත කාල සීමාවට සකස් කරල ලද ඔරලෝසු
    - IV. ප්‍රජා පාදක සහභාගීත්වයෙන්

* CEB සහ LECO වගකීම යුතුකම සහ වගකීම.

එක් එක් පළාත් පාලන ප්‍රදේශයක අවම වශයෙන් වසර 2ක ට වරක්වත් එම බල ප්‍රදේශය මාර්ග ආලෝකනය පිළිබඳ වෙන් කරන ලද විදුලි ඒකක ප්‍රමාණය සහ භාවතා කල හැකි (පහන් සංඛ්‍යාව සහ ක්ෂමතාවය) පළාත් පාලන ආයතනයට දැන්වීම.

අවශ්‍යතාවය අනුව විධිමත් ලෙස මාර්ග ආලෝකන පහන් සවිකිරීමට පහසුකම සැලැස්වීම.

මංවර එළ කිරීමේදී පළාත් පාලන ආයතන වල සහය ලබා ගැනීම.

* ප්‍රශස්ත හා ගුනාත්මක විදුලි සැපයුමක් ලබා දීම.

තනි තනි කණුවල පහන් ක්‍රියාත්මක කිරීම අවම කිරීම සඳහා සැපයුම් මාර්ග වලට බෙදා හැරීමේ මාර්ග යෙදීමේදී අහස් පොදි රැහැන් (Aerial Bundle Conductor) වීථි පහන් පාලක රැහැන්ද සහිතව භාවිත කිරීම.

මාර්ග ආලෝකන පහන් සඳහා නියමිත දිනට නඩත්තු මුදල අදාල පළාත් පාලන ආයතනය වෙත ගෙවීම් කිරීම.

අනාරක්ෂිත ලෙස සවි කර ඇති විදුලි පහන් ඉවත් කිරීම හෝ විධිමත්ව සවි කිරීම.

අනවසර සවි කිරීම සහ පුහුණු ශ්‍රමිකයන් විසින් සිදු කරන හානි කර ක්‍රියා වලක්වා ගැනීමට පළාත් පාලන ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම. පුහුණු ශ්‍රමිකයන් යෙදවීම සහ ඔවුන්ගේ දැනුම ආකල්ප යාවත්කාලීන කිරීම.

වසරේ එක් එක් කාල සීමාවන් දිවා කල / රාත්‍රී කාල වලදී පහන් දැල්වීම සහ නිවීම කළ යුතු වේලාවන් ප්‍රකාශයට පත් කිරීම.

ප්‍රමිතියට අනුකූල සහ තිරසාර භාවිතය සඳහා අවශ්‍ය සහ උපකරණ පිළිබඳ සේවකයන් සහ නිලධාරීන් දැනුවත් කිරීම.

විදුලි පද්ධතිය සහ ස්ථාපන වල රෙගුලාසි සහ නීති අනුව පරීක්ෂාවන් කිරීම යන ඒවා නිවැරදි කිරීමට උපදෙස් දීම.

* **<u>පළාත් පාලන ආයතන සතු යුතුකම හා වගකීම සහ වගකීම,</u>**

යාවත් කාලීන කරනු ලබන මාර්ග ආලෝකන පහන් ලේඛනවිධිමත්ව පවත්වාගෙන යාම.

ප්‍රමිතියට අනුකූල ද්‍රව්‍ය භාවිතයේ යෙදීම සහ නිර්දේශ කරනු ලබන ක්ෂමතාවය සහිත පහන් අදාල ස්ථාන වල සවි කිරීම, ක්‍රියාත්මක කිරීම.

නියමිත පුහුණුව ලැබූ කාර්මිකයන් සේවයේ යෙදවීම සහ අනවසර සවිකිරීම් සිදු නොකිරීම අවශ්‍ය ස්ථාන වල වීථි පහන් සවි කිරීම සහ දැනටමත් ක්‍රමවත්ව සවිකර නොමැති පහන් ඉවත් කර අවශ්‍ය ස්ථාන වලට සවි කිරීම.

නියමිත අවස්ථා වලදී පහන් සැල්වීම සහ නිවීම සිදු කිරීමට පියවර ගැනීම.

* ප්‍රජාව විසින් පහන් දැල්වීම සිදු කරන්නේනම් ස්විච ආරක්ෂිත ලෙස සවිකර දීම මංවර එළිකිරීම පිලිබඳ ප්‍රජා දැනුවත් කිරීම.

* (මංවර එළි කිරීම නිසා අඩු කක්ෂමතාවකින් යුතු පහන් භාවිතයට හැකිවීම) නියමිත කාල සීමාවේදී LECO / CEB මඟින් .මාර්ග ආලෝකන (වීථි) පහන් නඩත්තු මුදල් ලබා ගැනීම.

* පසු භාවිත පහන් සහ අනෙකුත් ද්‍රව්‍ය පරිසර හිතකාමී ලෙස ප්‍රතිචක්‍රී කරණය කටයුතු කිරීම.

තිරසාර සංවර්ධනය සඳහා පුණර්ජනනීය බලශක්තියභාවිතයට කටයුතු කිරීම. එම ව්‍යෘපෘති සඳහා අවශ්‍ය දිරිගැන්වීම් කිරීම.

සූර්ය, ජීව වායු, සුළි, කුඩා පරිමාන විදුලි බලාගාර මෙන්ම බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිල්ල ඉදි කිරීමට දිරි ගැන්වීම සිදු කිරීම.

* **<u>ප්‍රජාව සතු වගකීම සහ වගකීම සහ යුතුකම.</u>**

- * මාර්ග ආලෝකන පහන් නියමිත වේලාවට දැල්වීම සහ නිවීමට සහය වීම
- * මාර්ග අසල ගස් සිටුවීම වැලැක්වීම සහ මංවර එළ කිරීමේදී සහය දැක්වීම.
- * පහන් දැල්වීම සහ නිවීම නියමිත පරිදි සිදු නොවන විටදී අදාල ආයතනවලට දැනුම් දීම.
- * මාර්ග ආලෝකන පහන් වලට හානි නොකිරීම.

* **<u>බලශක්ති ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස,</u>**

- සූර්ය බලශක්තිය භාවිතය සඳහා සහ ගොඩනැගිලිවල වහල ආයෝජකයන් වෙත බඳු දීම හෝ සභාව මඟින් සිදු කිරීම. (SOLARNET METERING SYSTEM) සවි කිරීමෙන් සභාවේ මෙන්ම මාර්ග ආලෝකන පහන් සඳහා යන විදුලි බිල අඩු කරගත හැක.

* <u>ආලෝකනය - Light.</u>

සූර්යා ප්‍රධානතම ශක්ති ප්‍රභවයයි. ඉන් ලැබෙන ආලෝකය ජීවය මෙන් අජීවය ද සිය පැවැත්මට වැදගත්වේ. සූර්ය ලෝකය නොමැති විටදී ආලෝකය අවශ්‍ය වූ විටදී වෙනත් වර්ගයක ශක්තියක් ආලෝක තරංග බවට පෙරලාගත හැකි උපකරණයක් නිපදවා ගැනීමට අතීතයේ සිටම මානවයා ඉතා උනන්දුවක් දැක්විය.

තරංග ආයාමය380 – 780 nm = 1 nm = 10^{-9} m විද්‍යුත් චුම්භක විකිරණ තරංග දෘශ්‍ය තරංග වේ. එම තරංග ඇස පතිත වූ විට ඇතිවන භෞතික සංවේදනය ආලෝකය ලෙස හැදින්වේ.
දෘෂ්ඨිය සාමාන්‍ය වූ විට අශ්‍ය වර්නාවලියේ මැද ප්‍රදේශයේ ආලෝක තරංග වලට මිනිස් ඇස වඩාත් සංවේදීය.

* <u>ආලෝකන ක්‍රම - Lighting.</u>

I. ගොඩනැගිලි අභ්‍යන්තර ප්‍රදීපනය - In door lighting
II. බාහිර ප්‍රදීපනය - Out door lighting
III. මාර්ග ප්‍රදීපනය - Road way lighting

* <u>මාර්ග ආලෝකනය - අරමුණු.</u>

රාත්‍රී කාලයේදී මාර්ග භාවිතා කරනු ලබන

I. පදිකයන්ගේ ආරක්ෂාව.
II. සොරසතුරු බිය අවම කර ගැනීම.
III. අඳුරේදී සුරක්ෂිත බව සහ පහසු බව.
IV. ප්‍රදේශ ආලංකරණය.

<u>ආලෝකය සම්බන්ධ ඒකක.</u>

එක් පහනක් මඟින් මිනිස් ඇසට පෙනෙන තත්පර 1ක කාලසීමාවන් තුල සියළු දිශාවන්ට පිටකරනු ලබන ආලෝක ප්‍රමානය luminous flux(f) ලුමන 1කි. (1m)

GLS 100W	12 W LED	20 W LED	23 W CFL
1200 – 1400 lm	1200 lm	2000 lm	1600 lm

* <u>Luminous Intensity (I)</u>

නිශ්චිත දිශාවකට ආලෝක ප්‍රභවයක් මඟින් විකිරණය කරනුලබන ආලෝක ප්‍රමානය කැන්ඩෙලා (cd) වේ.

I luminance (E) ප්‍රදීපනය

* <u>Lumen per square meter – LUX</u>

* Luminance –Candela per Square meter (Cd / m^2)

* <u>බල්බයෙන් නිකුත් වන ආලෝකයේ වර්ගය අනුව,</u>

Color temperature – Correlated Color Temperature

CCT [K] - Color of light

<3300 k Warmwhite WW

3300k 5000k Natural White NW

> 5000 k day light D

* <u>ආලෝකය ගණනය කිරීම.</u>

<u>සාධක ප්‍රයෝජනය සංගණනය.</u>

මුලු ලුමන ප්‍රතිදානයෙන් කොටසක් කාර්යතලය වෙත එළඹීම මේ සංගුණකයෙන් සැලකිල්ලට ගැනේ.

කාමරයේ හැඩය සහ විශාලත්වය සිවිලිමේ හා බිත්ති වල පැහැය සවිකුරු සහ පරාවර්තන වර්ගය මෙයට අදාල වේ.

<u>ක්ෂය සාධකය.</u>

පරාවර්තන මත දූවිලි එකතු වීම දූවිලි නිසා සිවිලිමේ හා බිත්ති වල පරාවර්තන ගුණය අඩු වීම යන කරුණු නිසා පිහිටුවීමේ කාර්යක්ෂමතාව මැනීම මෙය සැලකිල්ලට ගැනේ.

* <u>ආලෝක සවිකුරුව - (Luminaires)</u>

අලෝකන සවිකුරුවක් යනු ආලෝක ප්‍රභව බල්බ / බල්බ ආලෝකය බෙදාහරින කොටස් ලාම්පුවේ ආරක්ෂාව සහ සවිකිරීමට අදාලව සහ සැපයුමට සම්බන්ධව කිරීමට අවශ්‍ය අංග සියල්ලටම සමන්විත වූවකි.

* බල්බ - හෝල්ඩර් හෝ ජේනු
* අනුබාධක අඟර
* පරාවර්තන - ආලෝකය දිශ ගත කිරීම
* විසරණයෙන් ආවරණය කිරීමට අදාල කොටසු (දෘශය අපහසුතා වැලැක්වීමට)
* විදුලි උපාංග සියල්ල සමන්විත බාහිර ආවරණය වේ.

* **<u>ආලෝක්ෂයට ද දූෂණය කල හැක.</u>**

සෙවනැලි සහ ගිනිකණ වැටීමෙන් ආලෝකයටද දූෂනයක් කල හැක.

<u>ආයු කාලය,</u>

I. සූතිකා (GLS) - පැය 1000
II. CFL - පැය 8000 - 10,000
III. LED - පැය 15000 - 25000

* **<u>මාර්ග ආලෝකනය සඳහා නිර්දේශ කරනු ලබන LED බල්බ වල ක්ෂමතාවය සහ වර්ණය.</u>**

මාර්ග ආලෝකන පහන් අතර තිබිය යුතු දුර හා වොට් ගණන,

- 20 W (1900 – 2000 lumens) E27 LED බල්බ Day light සෑම කණුවක් සඳහාම - ප්‍රධාන මාර්ග, වාණිජ ප්‍රදේශ, පෞද්ගලික.
- 20 W (1900 – 2000 lumens) E27 LED බල්බ WARM White ප්‍රධාන මාර්ගය සමඟ සම්බන්ධ අතුරු මාර්ග ආරම්භ වන (ප්‍රධාන මාර්ගයේ පහන් කණු සඳහා)
- සෑම අතුරු මාර්ගයක් සඳහා (කණුවක් හැර කණුවක්) 12 W – 12.5 W LED - Day light – 1200 – 1250 lumens බල්බ.
- සුසාන භූමි, උද්‍යාන, ඇවිදින මංතීරු සඳහා 12 W – 12.5 W LED –WARM With E27 බල්බ.

* මූලික සතත්ව අයිතිවාසිකම්,

රාත්‍රී කාලයේදී Day light පහන් භාවිතා කිරීමෙන් සතුන් දෛනික ක්‍රියාකාරකම් යන ජීවනරටාව වෙනස් කිරීම සත්තව අයිතිවාසිකම් උල්ලංගනය කිරීමකි.

“සඳ එලියේ සහ රාත්‍රියේ අසිරිය කරුණාකර ඔවුන්ටද ජීවිතය විදින්න ඉඩ දෙන්න”

පී.යූ.පී.කුමාර ද සිල්වා,
පළාත් ඉංජිනේරු සේවා කාර්යාලය,
කොටුව, ගාල්ල.
udayapushpa@sltnet.lk